JMC vLearning
"your virtual learning partner"

# නියෝජ්‍යත්වය පිළිබඳ නීතිය - Law of Agency

නදීකා ජයසිංහ

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

## නියෝජ්‍යත්වය යනු කුමක්ද?

එක් පුද්ගලයකු තමා වෙනුවෙන් නියෝජනය කිරීමට තවත් පුද්ගලයකුට ප්‍රකාශිතව හෝ ව්‍යංගයෙන් බලය දුන් සහ අනෙක් පුද්ගලයා ඊට එකඟ වු විට ඇති වන සබඳතාවය නියෝජ්‍යත්වය ලෙස සරලව හැඳින්විය හැක.

මේ අනුව යම් තැනැත්තකු ඔහු වෙනුවෙන් යම්කිසි කටයුත්තක් ඉටුකරවා ගැනීම සඳහා තවත් අයකු යොදවා ගැනීමෙන් නියෝජ්‍යත්ව සබඳතාව ඇති වේ. මෙහිදී අදාළ කාර්යය ඉටුකරවා ගැනීමට අවශ්‍යතාව තිබෙන තැනැත්තා හෙවත් බලය පවරන තැනැත්තා ප්‍රධානියා (Principal) ලෙසත්, ප්‍රධානියා වෙනුවෙන් කාර්යය ඉටුකරවා ගැනීමට පත්කර ගනු ලබන තැනැත්තා (Agent) ලෙසද හැඳින්වේ. චාර්ල්ස්වර්ත් නැමති රචකයා අර්ථ දක්වා ඇති පරිදි නියෝජිතයා යනු, බාහිර පාර්ශවයක් සඳහා ගිවිසුම් සබඳතා ඇති කරවා ගැනීම සඳහා සේවයේ යොදවන තැනැත්තාය.

මෙරට නියෝජ්‍යත්වය සම්බන්ධයෙන් ඉංග්‍රීසි නීතිය අදාළ වන බව 1852 අංක 05 දරණ සිවිල් නීති ආඥා පනතේ 03 වන වගන්තියේ සඳහන් වේ.

## නියෝජ්‍යත්වය ඇතිවිය හැකි ආකාර

### 1. අන්‍යෝන්‍ය එකඟතාව මත (By Mutual Agrement) (ප්‍රකාශිතව පත් කිරීම මගින්)

මෙම සබඳතාවය ලිඛිත හෝ වාචිකව ඇතිවිය හැක. ලිඛිත නියෝජ්‍යත්වය සඳහා උදාහරණ, විදේශ රටක සිටින තැනැත්තකු මෙරට පවතින නම දේපළ සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඇටෝනි බලපත්‍රයක් මගින් (ඡදඇර ද෴ ඓඑදරබැහ) නියෝජිතයකු පත්කර ගනී.එසේම සේවාදායකයකු තම පාර්ශවකරුවකු වන සිවිල් නඩු කටයුත්තකදී තමන් වෙනුවෙන් නඩුවට පෙනී සිටීමට පෙරකලාසියක් මගින් (ඡරදංහ) නීතිඥවරයකු පත්කර ගැනීමට ලිඛිතව නියෝජිතයකු පත්කර ගැනීම.

### 2. අපරානුමැතියෙන් (පසුව අනුමත කිරීමෙන්) (Subsequent Ratification)

ප්‍රධානියා වෙනුවෙන් නියෝජිතයා විසින් කරනු ලබන බලය නොලැබූ ක්‍රියාවක් හෝ දී ඇති බලය ඉක්මවා කළ ක්‍රියාවක් හෝ පසුව අනුමත කිරීම ප්‍රධානියාට කළ හැකිය. එවැනි ක්‍රියාවක් ප්‍රධානියා විසින් අනුමත කරනු ලැබුවහොත් නියෝජිතයාට ඒ සඳහා බලය ලැබුනා සේ සලකන අතර පසුව අනුමැතියෙන් හෝ අපරානුමැතියෙන් නියෝජ්‍යත්වය බිහිවූවා ලෙස සලකයි. Kelner Vs Baxter :1866 නඩුවේදී අධිකරණය තීරණය කළේ නියෝජිතයකු වෙනුවෙන් ගිවිසුමකට ඇතුලත් වන අවස්ථාවේ දී එබඳු ගිවිසුමකට ඇතුලත් වීමට ශක්තියක් ඇති ප්‍රධානියකු සිටිය යුතුය. එම ප්‍රධානියා ස්වභාවික පුද්ගලයකු හෝ නෛතික පුද්ගලභාවයක් සහිත ආයතනයක් හෝ විය හැකි බව මෙම නඩු තීන්දුවේදී තීරණය විය. එසේම අපරානුමැතියෙන් නියෝජ්‍යත්ව සබඳතාවක් ඇතිවීමට නම්, නියෝජිතයා විසින් ඇතුලත් වී ඇති ගිවිසුම නීතිවිරෝධි හෝ හිස් ගිවිසුමක් හෝ නොවිය යුතුය. ප්‍රධානියා විසින් අදාළ ගිවිසුම අනුමත කිරීමට පෙර ඊට අදාළ වු සියලුම කරුණු නියෝජිතයා විසින් ප්‍රධානියාට දන්වා තිබිය යුතුය. එසේම ප්‍රධානියා විසින් සාධාරණ කාලයක් ඇතුලත නියෝජිතයා ඇතුලත් වු ගිවිසුම අනුමත කළ යුතුය.

### 3. අවශ්‍යතාවය මත (By Neccessity)

කල් ඇතිව ඇතිකර ගත් එකඟතාවක් හෝ පත්කර ගැනීමක් හෝ තොරව සමහර අවස්ථා වලදී කෙනෙකුට තවත් කෙනෙකුගේ අවසරයක් නොමැති වුවද ගිවිසුමකට ඇතුලත් විය හැකිය. මෙසේ සාමාන්‍යයෙන් අයකු තවත් අයකුගේ දේපළක් භාරව සිටින විට ඒවා සංරක්ෂණය කිරීමට හෝ පුනරුත්තාපනය කිරීමට කටයුතු කළහොත් අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය හට ගනී.

අවශ්‍යතාවය මත නියෝජ්‍යත්ව සබඳතාවක් ඇති වීමට සපිරිය යුතු කරුණු:

(i) භාණ්ඩ භාරයේ සිටින තැනැත්තාට දැරීමට සිදුවන හදිසි තත්ත්වයක් යටතේ ඒවා භාර ගැනීමට ඔහුට සිදු වේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

(ii) ඇති වී තිබෙන හදිසි තත්ත්වයක් යටතේ ගතයුතු පියවරක් යටතේ කිසියම් පියවරක්, භාණ්ඩ ලබාගත නොහැකි තත්ත්වයක් ඇති වුවා විය හැකිය.
(iii) භාණ්ඩ භාරයේ සිටින පුද්ගලයා එම හදිසි ගිවිසුමට ඇතුලත් වුයේ නැතහොත් අදාළ පියවර ගන්නේ දේපළ අයිතිකරුගේ යහපත සඳහා මිස ඔහුගේ පහසුව සඳහා නොවිය යුතුය.

### 4. ප්‍රතිබන්ධන රීතිය යෙදීමෙන් (By the Rule of Estoppel)

යම් තැනැත්තකුගේ ක්‍රියා කලාපය හේතු කොටගෙන යම් කෙනෙකුගේ සිතෙහි යම් කරුණු කිහිපයක් සත්‍ය වන බවට යම් විශ්වාසයක් ඇති වන අතර ඒ කරුණු මත විශ්වාසය තබමින් අනෙක් පාර්ශවය යම් පියවරක් ගැනීමෙන් පසු එකී කරුණු සත්‍ය නොවන බවට පෙනී ගියත් මුලින් එම කරුණු පිළිගත් පුද්ගලයාට එම කරුණු සත්‍ය නොවන බව ප්‍රකාශ කිරීමට නීතියෙන් ඉඩ නොදේ. කිසියම් පුද්ගලයෙක් මුලින් කළ ප්‍රකාශයෙන් හෝ ක්‍රියාවෙන් පසුවට ද බැඳී සිටීම ප්‍රතිබන්ධන රීතියයි. මෙම ප්‍රතිබන්ධන රීතිය යෙදීමෙන් දෙදෙනෙකු අතර ප්‍රධානියා හා නියෝජිතයා අතර ඇති වන නියෝජ්‍යත්ව සබඳතාවක් ඇති විය හැක.

උදාහරණ:

A, B ගේ බලයලත් නියෝජිතයා නොවේ. නමුත් ඔහු තමාගේ නියෝජිතයා ලෙස X ට පෙන්නුම් කෙරෙන ආකාරයට ක්‍රියා කරන බව B දැන සිටියත් A තමාගේ නියෝජිතයකු නොවන බව X ට දැනුම් දීම B විසින් පැහැර හරිනු ලබයි. මේ නිසා A, B ගේ බලය ලත් නියෝජිතයා යැයි විශ්වාස කරමින් X, A සමග ගිවිසුමකට ඇතුලත් වේ. මෙහිදී ඇත්ත වශයෙන්ම A, B ගේ බලය ලත් නියෝජිතයා නොවුවත් ප්‍රතිබන්ධන රීතියේ දී මෙන් B හා A අතර නියෝජ්‍යත්ව සබඳතාවක් එම ගිවිසුමට අදාළව ඇති වුයේ යැයි නීතිය නිගමනය කරයි.

2013.01.01 දින A, B ගේ බලයලත් නියෝජිතයා ලෙස පත් කරයි. 2013.006.01 දින එම සබඳතාව අවසන් කරයි. මෙම මාස 06 ක කාලසීමාව තුළ X, A මගින් B සමග ගිවිසුමකට ඇතුලත් වී A ගේ නියෝජිතභාවය අවසන් කිරීමෙන් පසුව එය නොදැන 2013.06.10 වන දින සුපුරුදු පරිදි X, A මගින් B සමග ගිවිසුමකට ඇතුලත් වේ. මෙම දිනය වන විට A හා B අතර නියෝජ්‍යත්ව සබඳතාවක් නොතිබුණත් ඒ බව ප්‍රකාශයට පත් නොකිරීම නිසා ප්‍රතිබන්ධන රීතියේ මෙන් ඔවුන් අතර එවැනි සබඳතාවක් තිබුනු බවට නීතිය සලකයි.

### 5. විවාහක ස්ත්‍රීන්ගේ සබඳතාව මගින් නියෝජ්‍යත්වය ඇති වීම (Agency of Married Woman)

ගෙදර දොර අවශ්‍යතාවයන් ලබා ගැනීම සඳහා භාර්යාව පුරුෂයාගේ නියෝජිතයා ලෙස ඉංග්‍රීසි නීතිය තුළ සැලකේ. නමුත් රෝම ලන්දේසි නීතියට අනුව නම් එම බලය භාර්යාවට ලැබෙන්නේ නියෝජ්‍යත්වයෙන් නොව විවාහ බලයෙනි.

## නියෝජිතයෙකුගේ බලය

නියෝජිතයාගේ ක්‍රියාවෙන් ප්‍රධානියා වගකීමට බැඳීමට නම් එම නියෝජිතයාට නියෝජන බලයක් පැවතිය යුතුය. නියෝජිතයෙන් සතු බලය කොටස් 3 කට බෙදා දැක්විය හැක.

1. ප්‍රකාශිත බලය – Express Authority

   එනම්,

   ..........................................................................................................................
   ..........................................................................................................................
   ..........................................................................................................................
   ...........................................................................................................

2. වටහාගත හැකි බලය – Implied Authority


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

එනම්,
................................................................................................................................
................................................................................................................................
................................................................................................................................
.........................................................................................................

### 3. දෘශ්‍ය බලය - Apparent Authority

එනම්,
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
.....................................................................................................................

**උදා :** A හා B එළවළු විකුණන හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෝ වෙති.

1. A ට නොදන්වා එළවළු තොගයක් මිලදී ගැනීමට B, C සමග ගිවිසුමකට ඇතුලත් වේ නම් එම ගිවිසුමෙන් A ද වගකීමකට බැදේ.

   මන්ද,

   B ට වටහාගත හැකි බලයක් ඇති බැවිනි.

2. ඉහත කී නිදර්ශනයේ හවුල් ව්‍යාපාරය වෙනුවෙන් කිසිදු ගිවිසුමකට ඇතුළු වීම නොකළ යුතු බවට B ට තහනමක් පනවා ඇත්නම්,

   එම තහනම නොතකන B හවුල් ව්‍යාපාරය වෙනුවෙන් එළවළු තොගයක් මිලදී ගැනීමට C සමග ගිවිසුමකට ඇතුළු වේ.

   එම ගිවිසුමෙන් A වගකීමට බැදේ. මන්ද, එවැනි තහනමක් පිළිබඳ නොදත් C ට, B ට එම ගිවිසුමට ඇතුලත් වීමට බලයක් ඇති බවට සාධාරණව පෙනී යන බැවිනි, එනම් B ට දෘශ්‍ය බලයක් ඇති බැවිනි.

3. ඉහත 2 වන නිදර්ශනයේ B, C සමග ගිවිසුමට ඇතුලත් වන්නේ හවුල් ව්‍යාපාරයේ විකිණීමට මෝටර් රථ 5 ක් මිලදී ගැනීමට නම් එම ගිවිසුමෙන් A වගකීමට නොබැදේ. මන්ද, B ට ප්‍රකාශිත හෝ වටහාගත නැති දෘශ්‍ය බලයක් නොමැති බැවිනි.

## නියෝජිතයෙකුගේ යුතුකම් / ප්‍රධානියාගේ අයිතිවාසිකම්

### 1. ඉටු කිරීම

එනම් නියෝජිතයාට පැවරූ කාර්යය ඉටුකිරීමට යුතුකමින් බැදේ. කාර්ය ඉටු නොකිරීම හේතුවෙන් ප්‍රධානියාට අලාභයක් වේ නම් එය නියෝජිතයාගෙන් අයකර ගත හැක.

උදා: Turpin Vs Bilton

නැවු හිමියෙකු වූ A තම නැවු මුදුගමන් වල යෙදෙන අවස්ථා වලදී රක්ෂණය කිරීමට ඊ ව පත්කරන ලදී. A ගේ නැවක් මුදු ගමනකදී අනතුරට පත් වු අතර, B එම නැව රක්ෂණය කර නොතිබුණි. එමනිසා A ට වූ අලාභ B විසින් ගෙවිය යුතු බව අධිකරණය තීරණය කරන ලදී.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### 2. නියෝජිතයා විසින් පුද්ගලිකවම එකී කාර්ය ඉටුකල යුතුය.

මෙය "Delegatus Non Potest Delegare" යනුවෙන් හඳුන්වනු ලබයි.

එනම් නියෝජිතයාට පැවරූ කාර්ය වෙනත් අය ලවා ඉටුකරවා ගැනීමට නියෝජිතයාට නීතිමය හැකියාවක් නැත. නියෝජිතයා පුද්ගලිකව එම කාර්ය ඉටුකල යුතුය.

කෙසේ නමුත් මෙම නෛතික සිද්ධාන්තයට ව්‍යතිරේඛ අවස්ථා ඇත.

1. කාර්ය වෙනත් අයකු ලවා ඉටුකරවා ගැනීමට ප්‍රධානියාගේ අනුමැතිය ලැබී තිබීම
2. නියෝජිතයෙකු ලෙස නෛතික පුද්ගලයෙක් පත්කර ඇති විට (සමාගම, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල) එහි නිලධාරීන් හා සේවකයින් මගින් අදාල කාර්ය ඉටුකරවා ගැනීමට සිදුවේ.

### 3. නියෝජිතයා තම කාර්ය ඉටුකිරීමේ දී සාධාරණ සැලකිල්ලක් හා දක්ෂතාවයෙකින් යුතුව එකී කාර්ය ඉටුකල යුතුය. (Care and Skill)

### 4. නියෝජිතයා තමාගේ අයිතිවාසිකම් හා ප්‍රධානියාගේ අයිතිවාසිකම් අතර ගැටෙන තත්ත්වයකට තමන්ව පත්කර නොගැනීමේ යුතුකමකින් බැදේ.

උදා: Mcpherson Vs Watt

ප්‍රධානියා තමාගේ ඉඩමක් විකිණීමට නියෝජිතයෙකු පත් කරන ලදී. එම ඉඩම තමාටම මිලදී ගැනීමේ චේතනාව නියෝජිතයාට පැවතියද ඔහු එය ප්‍රධානියාට හෙළි නොකොට ඔහුගේ සහෝදරයෙකුගේ නමින් මිලදී ගන්නා ලදී.

ඉහත කී යුතුකම නියෝජිතයා කඩකර ඇති බව අධිකරණය තීරණය කරන ලදී. මන්ද ප්‍රධානියාගේ ඉඩම විකිණීමට නියෝජිතයා ක්‍රියා කිරීමේදී ඔහුගේ යුතුකම වන්නේ හැකි උපරිම මිලකට එය විකිණීමට උත්සාහ ගැනීම වන අතර යමෙකු තමා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීමේදී උත්සාහ ගන්නේ හැකි අවම මිලට එය මිලදී ගැනීමට උත්සාහ ගැනීම වන බැවිනි.

නමුත් ප්‍රධානියාගේ අවසරය හා අනුදැනුම මත නියෝජිතයා එම භාණ්ඩ තමාටම මිලදී ගැනීනම් මෙම යුතුකම කඩ නොවේ.

### 5. රහස් කොමිස් මුදල් ලබා නොගැනීමේ යුතුකම

ගිවිසුමකට ඇතුළුවීමෙන් පසුව නියෝජිතයා රහස් කොමිස් මුදල් ලබාගෙන ඇති බව ප්‍රධානියාට පෙනී යයි නම්, ඔහුට නියෝජිතයාට එරෙහිව මෙන්ම තුන්වන පාර්ශවයට එරෙහිව පහත පරිදි ක්‍රියාකල හැක.

A. නියෝජිතයාට එරෙහිව ඇති ප්‍රතිකර්ම නියෝජිතයාගෙන්

* ප්‍රධානියාට එම රහස් කොමිස් මුදල අය කරවා ගත හැක.
* පූර්ව දැනුම් දීමකින් තොරව නියෝජිතභාවය අහෝසි කල හැක.
* නියෝජිතයාට ගෙවන නියෝජිත ගාස්තුව (කොමිස්, වැටුප්) ගෙවීම ප්‍රතික්ෂේප කල හැක.

B. තුන්වන පාර්ශවයට එරෙහිව ඇති ප්‍රතිකර්ම

* තුන්වන පාර්ශවය සමඟ ඇතුලත් වූ ගිවිසුම අවලංගු කරවා ගත හැක.මෙහිදී රහස් කොමිස් මුදල් ගෙවීම හේතුවෙන් ප්‍රධානියාට අගතියක් සිදුවිද නැද්ද යන්න වැදගත් නොවේ. අල්ලස් දීම හේතුවෙන් ප්‍රධානියා එම ගිවිසුමෙන් බැදී නොසිටියි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- රහස් කොමිස් මුදල් ගෙවීම හේතුවෙන් ප්‍රධානියාට අලාභයක් වී ඇත්නම් එම අලාභය අය කරවා ගත හැක.

### ප්‍රධානියාගේ යුතුකම් / නියෝජිතයාගේ අයිතිවාසිකම්

1. නියෝජිතයාට ගෙවීමට එකඟ වූ නියෝජන ගාස්තුව ගෙවිය යුතුය.
2. නියෝජිතයා තම කාර්ය ඉටුකිරීමේදී යම් මුදලක් වැයකර ඇත්නම් ප්‍රධානියා එම මුදල ප්‍රතිපූර්ණය කල යුතුයි.
3. තම කාර්ය ඉටුකිරීමේදී නියෝජිතයා යම් වගකීමකට ලක් වී ඇත්නම්, ප්‍රධානියා එම වගකීම නිදහස් කල යුතුය.

## නියෝජිතයින් වර්ග

### 1. වෙළඳ නියෝජිතයෝ (Factor)

ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීමට හෝ විකිණීමට මොහුට බලය ඇත. මොවුන්ගේ විශේෂත්වය වන්නේ විකුණන හෝ මිලදි ගන්නා භාණ්ඩ වල භුක්තිය හිමිව පැවතීමයි.

වෙළඳ නියෝජිතයෙකු විසින් තම ප්‍රධානියා විසින් ලබාදුන් බලය ඉක්මවා ක්‍රියාකර තිබුන ද එම ගිවිසුමෙන් ප්‍රධානියා වගකීමට බැදේ. මන්ද වෙළඳ නියෝජිතට දෘශ්‍ය බලයක් ඇති බැවිනි.

A තම මෝටර් රථය 500,000 ක අවම මිලකට විකුණා දෙන ලෙස පවසමින් B නැමති වෙළඳ නියෝජිතට බාර දේ. B එම මෝටර් රථය 450,000/- ට ක ට විකුණයි. නමුත් නම් එම ගිවිසුමෙන් A වගකීමකට බැදේ. මන්ද B ට දෘශ්‍ය බලයක් ඇති බැවිනි.

### 2. තැරැව්කරු (Broker)

ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ විකිණීමට හෝ මිලදී ගැනීමට මොවුන්ට බලය ඇත. නමුත් මොවුන්ගේ ඇති විශේෂත්වය වන්නේ කිසිවිටකත් එම භාණ්ඩවල භුක්තිය මොවුන්ට හිමි නොවීමයි.

### 3. කැපකරු නියෝජිත (Del Credare Agent)

තමා විසින් සොයාගත් ගැණුම්කරුවන්ට ණයට භාණ්ඩ විකුණා එම ණය අයකර ගැනීමේ අවධානම ද බාරගනු ලබන නියෝජිතයෙකු මෙලෙස හඳුන්වනු ලබයි.

මොවුන් අමතර අවධානමක් බාරගන්නා බැවින් කැපකරු කොමිස් ලෙස හඳුන්වන අමතර කොමිස් මුදලකට හිමිකම් ලබයි.

### 4. වෙන්දේසිකරු (Auctioner)

ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් භාණ්ඩ විකිණීම හෝ මිලදී ගැනීම මොහු විසින් කරයි.

ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් භාණ්ඩ විකිණීමේදී ලංසු තැබීම අර්පණය ලෙසත් වෙන්දේසිකරු විසින් මිටය පහත හෙලීම ප්‍රතිග්‍රහණය ලෙසින් සැලකේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## නියෝජ්‍යත්වය අවසන් වීම

| | | |
|---|---|---|
| L | Frustration | - ව්‍යර්ත වීම |
| P | Revocation | - බලය ඉල්ලා අස්කර ගැනීම |
| L | Death | - මිය යෑම |
| L | Bankruptcy | - බුන්වත් වීම |
| P | Completion | - ඉටු කිරීම |
| P | Renunciation | - බලය අතහැරීම |
| L | Insanity | - උමතු බව |
| L | Custom | - සිරිත් |
| LP | Enemy | - සතුරු බවට පත්වීම |
| L | Time | - කාලය ගෙවී යාම |

### 1. ව්‍යර්ථ වීම

නියෝජ්‍ය නියෝජිත සම්බන්ධභාවයේ විෂය වස්තුව විනාශ වීම, ඉටු කල යුතු කාර්යය පසුව නීතිවිරෝධි වීම ආදී හේතූන් මත මෙම සම්බන්ධතාවය අවසානයට පත් වේ.

### 2. බලය ඉල්ලා අස්කර ගැනීම

ප්‍රධානියා විසින් නියෝජිතයාට දී ඇති බලය ඉල්ලා අස්කර ගැනීම මත මෙම සම්බන්ධතාවය අවසානයට පත් වේ.

### 3. මිය යෑම

ප්‍රධානියා හෝ නියෝජිතයා මිය යෑමෙන් මෙම සම්බන්ධතාවය අවසානයට පත් වේ.

### 4. බුන්වත් වීම

ප්‍රධානියා බුන්වත් වීමෙන් මෙම සම්බන්ධතාවය අවසාන වේ.

### 5. ඉටු කිරීම

නියෝජිතයාට පැවරූ කාර්ය ඉටුකර අවසන් වීමෙන් මෙම සම්බන්ධතාවය අවසානයට පත් වේ.

### 6. උමතු බව

ප්‍රධානියා හෝ නියෝජිතයා උමතු බවට පත්වීම හේතුවෙන් මෙම සම්බන්ධතාවය අවසානයට පත් වේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### 7. බලය අත් හැරීම

නියෝජිතයා විසින් බලය අත්හැරීම හේතුවෙන් මෙම සම්බන්ධතාවය අවසානයට පත් වේ.

### 8. සිරිත්

යම් ව්‍යාපාරයක පිළිගත් සිරිත වන්නේ යම් සිද්ධියක් සිදු වූ විට නියෝජත්වය අවසන් වන බව නම් එවැනි සිද්ධියක් සිදුවූ විට දී නියෝජ්‍යත්වය අවසානයට පත් වේ.

### 9. සතුරු බවට පත් වීම

මෙය විශේෂයෙන් වැදගත් වන්නේ විදේශ නියෝජිතයන්ට අදාලවයි. එනම් ප්‍රධානියා සිටින රටක් නියෝජිතයා සිටින රටත් අතර යුද්ධයක් ප්‍රකාශයට පත් කලොත් දෙරටේ පුරවැසියන් එකිනෙකාගේ සතුරන් බවට පත් වේ.

### 10. කාලය ගෙවී යාම

නියෝජිතයාව පත්කර ඇත්තේ යම් නිශ්චිත කාලයකට නම් එම කාලය ඉකුත් වීම සමඟ මෙම සම්බන්ධතාවය අවසන් වේ.

ඉහත L ලෙස දක්වා ඇත්තේ නීතිය ක්‍රියාත්මකවීමේ සම්බන්ධතාව අවසන් වන අවස්ථාවන් වේ. ඉහත P ලෙස දක්වා ඇත්තේ පාර්ශවයන්ගේ ක්‍රියා හේතුවෙන් සම්බන්ධතාව අවසන් වන අවස්ථාවන්ය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd